# <u>එන්.එල්.තෙන්නකෝන්</u> එ. <u>ජාතික තරුණ සේවා සභාව</u>

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම/172/2018 - 2018 සැප්තැම්බර් මස 05 වන දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32 (1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්ය පටිපාටිය) රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මන්පිල

**කොමිෂන් සභා සාමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී.පුංචිහේවා

**කොමිෂන් සභා සාමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**කොමිෂන් සභා සාමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ - ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක:** එන්.එල්.තෙන්නකෝන් මහතා

**නොතීසි ලත් පාර්ශ්වය:** නම්කළ නිලධාරී, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික තරුණ සේවා සභාව

**පෙනී සිටීම:**

**අභියාචක** - එන්.එල්.තෙන්නකෝන් මහතා

**පොදු අධිකාරිය** - සරත් උක්වත්ත මහතා (තනතුර සඳහන් කර නැත), ජාතික තරුණ සේවා සභාව

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොණු කරන ලද දිනය | 2017 නොවැම්බර් 16 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2017 දෙසැම්බර් 08 |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017 දෙසැම්බර් 11 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018 ජනවාරි 11 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක 11.01.2018 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*ජාතික තරුණ සේවා සභාව මගින් අයදුම්පත් කැඳවා, කළමණාකාර සහායක තනතුර සඳහා 2017 සැප්තැම්බර් මාසය තුළදී සම්මුඛ පරීක්ෂණ පවත්වා කළමණාකාර සහායක තනතුරට බඳවාගත් තනතුරු ලාභීන්ගේ,*

*1) සියලුම අධ්‍යාපන සහතිකවල පිටපත්.*

*2) වෙනත් අමතර සුදුසුකම්වලට අදාළ සහතිකවල පිටපත්.*

*3) සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ ලකුණු.*

තොරතුරු නිලධාරියා 2017 දෙසැම්බර් 08 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ අභියාචක විසින් අංක 1 සහ 2 යටතේ ඉල්ලා සිටින තොරතුරු පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරක් වන බැවින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ වගන්ති අංක 5 (1) (අ) අනුව එම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන බව සහ අංක 3 යටතේ ඉල්ලා ඇති තොරතුරු පමණක් ලබාදෙන බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2017 දෙසැම්බර් 11 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් 2018 ජනවාරි 11 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සළකා බලන අවස්ථාවේදී උද්ගත වූ කාරණා:**

අභියාචක සඳහන් කළ ආකාරයට ඔහු විසින් ඉල්ලුම් කරන ලද තොරතුරුවලින් යම් ප්‍රමාණයක් ඔහු වෙත ලැබී තිබුණ ද, ඔහු එම තොරතුරුවලින් සෑහීමකට පත් වී නොමැත. අභියාචකගේ චෝදනාව වූයේ පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා විසින් ඔහු වෙත ලබා දුන් තොරතුරු සම්පූර්ණ නොවූ, නොමඟ යවන හෝ සාවද්‍ය තොරතුරු වන බවයි.

කෙසේ වෙතත්, 05.09.2018 දින පැවති අභියාචන වාරය වෙත පැමිණි අභියාචක සඳහන් කර සිටියේ ඔහු විසින් අංක 1 සහ 2 යටතේ ඉල්ලුම් කළ තොරතුරු පොදු අධිකාරිය විසින් මුල් අවස්ථාවේදී ප්‍රතික්ෂේප කළ ද, මේ වනවිට එම තොරතුරු තමා වෙත ලබා දී ඇති බවයි.

අභියාචන වාරයේදී, අභියාචක විසින් අංක 3 යටතේ ඉල්ලුම් කළ තොරතුරු ලබා දිය හැකිද යන්න පිළිබඳව කොමිසම විසින් පොදු අධිකාරියෙන් කරන ලද විමසීමට පිළිතුරු ලබා දෙමින් පොදු අධිකාරිය ප්‍රකාශ කර සිටියේ සම්මුඛ පරීක්ෂණයේදී 53 දෙනෙකු එම තනතුර සඳහා තෝරාගෙන ඇති අතර ඔවුන්ට ලබා දුන් ලකුණු ආයතනය සතු වන බැවින් එම තොරතුරු අභියාචක වෙත ලබාදීමට එකඟ වන බවයි.

**නියෝගය:**

ඒ අනුව, අභියාචක විසින් අංක 3 යටතේ ඉල්ලි ඇති තොරතුරු සති 2 ක් ඇතුළත අභියාචක වෙත ලබාදෙන ලෙසට සහ එහි ආවරණ ලිපියෙහි පිටපතක් කොමිසම වෙත ලබාදෙන ලෙසට කොමිසම විසින් පොදු අධිකාරියට නියෝග කරන ලදී. එම දැනුම්දීමෙන් අනතුරුව නඩු විභාගයේ කටයුතු අවසන් වෙයි.

අභියාචනය අවසන් කෙරේ.

*****

කොමිෂන් සභා රීතීන්හි රීති අංක 27 (ගාස්තු හා අභියාචන කාර්ය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශ්වය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.

______________________________

මහින්ද ගම්මන්පිල - සභාපති

______________________________

එස්.පී.පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

______________________________

ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් - කොමිෂන් සභා සාමාජික

______________________________

විනිසුරු රෝහිණී වල්ගම - කොමිෂන් සභා සාමාජික